ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>ඉන්දියාව රජය සහ TNA අතර සාකච්ඡා සාදරයෙන් පිළිගනී</u>

විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී 2022 මාර්තු 28 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්ධන් මහතා ප්‍රධාන දෙමළ ජාතික සන්ධාන (TNA) නියෝජිත පිරිසක් හමු විය.

2. මෙහිදී නවතම තත්ත්වය පිළිබඳව විදේශ අමාත්‍යතුමා දැනුවත් කෙරුණු අතර මාර්තු 25 වන දින රජය සහ දෙමළ ජාතික සන්ධානය අතර පැවති සාකච්ඡා පිළිබඳව වැඩි අවධානයක් යොමු විය. එහිදී දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, භූමිය භාවිතා කිරීම, අතුරුදන්වූවන්ගේ ගැටළුව, 13 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම සහ ඩයස්පෝරා ආයෝජන යනාදි කරුණු සාකච්ඡා වූ බව දෙමළ ජාතික සන්ධානය විසින් ප්‍රකාශ කරන ලදී.

3. ශ්‍රී ලංකා රජය සහ දෙමළ ජාතික සන්ධානය අතර සාකච්ඡා පෙරදී විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපතිතුමා අතර පැවැති හමුවේදී ද සාකච්ඡාවට ගැනිණ. පස්වරුවේ විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා සමඟ පැවති හමුවේදී එතුමා විසින් ජයිශංකර් මහතා වෙත මේ සම්බන්ධයෙන් වඩා විස්තර සහිත පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

4. රජය සහ දෙමළ ජාතික සන්ධානය අතර න්‍යාය පත්‍රයේ කරුණු සම්බන්ධයෙන් ධනාත්මක වර්ධනයන් විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී. එක්සත් ශ්‍රී ලංකාවක් තුළ සමානාත්මතාවය, යුක්තිය, සාමය සහ අභිමානය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දමිළ ජනතාවගේ අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ඉන්දියාව දිගින් දිගටම සහය දක්වා ඇති බව එතුමා අවධාරණය කළේය.

5. උතුරු සහ නැගෙනහිර පළාතේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතාවයේ දයකත්වය පිළිබඳව ද මෙම සෑම හමුවකදී ම සඳහන් විය. විදේශ කටයුතු අමාත්‍යතුමා අග්‍රාමාත්‍යතුමා සමඟ

එක්ව අතථ්‍ය ආකාරයෙන් යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කිරීම සම්බන්ධයෙන් සිය සතුට පළ කළේය.

6. විදේශ කටයුතු අමාත්‍යතුමා ධීවර සහ ජලජ සම්පත් අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා ද හමු විය. ධීවර ගැටළුව සහ බලය බෙදීම සම්බන්ධයෙන් වන කරුණු මෙහිදී සාකච්ඡා කරන ලදී.

***

කොළඹ
2022 මාර්තු 28